# ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
## (රක්ෂණ ක්ෂේත්‍රයේ නියාමක)

INSURANCE REGULATORY COMMISSION OF SRI LANKA

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ රියදුරු තනතුර සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. රියදුරු තනතුරට බඳවාගන්නා අයදුම්කරු කාර්යාල කාර්ය සහායක රාජකාරී වල යෙදීමටද අපේක්ෂා කෙරේ.

## රියැදුරු තනතුර

**ප්‍රධාන වගකීම්**

- **ප්‍රවාහනය සහ වාහන නඩත්තුව :**
  - ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (IRCSL) සේවකයින් සහ අමුත්තන් හෝ භාණ්ඩ අවසන් ගමනාන්තය වෙත ආරක්ෂිතව සහ නියමිත වේලාවට ප්‍රවාහනය කිරීම සහතික කිරීම;
  - ගමන් ආරම්භ කිරීමට පෙර සහ පසු දිනපතා වාහන පරීක්ෂා කිරීම සහ පවතින යාන්ත්‍රික ගැටළු කාර්ය භාර කළමනාකරු වෙත වාර්තා කිරීම;
  - වාහනයේ පිරිසිදුකම පවත්වා ගැනීම සහ අවශ්‍ය පරිදි ඉන්ධන පිරවීම, වාහන සෑම විටම ප්‍රශස්ත ක්‍රියාකාරී තත්වයේ පවතින බවට සහතික කිරීම.
- **කාර්යාල පරිපාලනය සහ වාර්තා කළමනාකරණය :**
  - කොමිසමෙහි වාර්තා කළමනාකරණ පද්ධතියේ වැඩ සඳහා සහාය වීම;
  - නියමිත දිනවලදී කාර්යාලය විවෘත කිරීම සහ වසා දැමීමේ රාජකාරි ඉටු කිරීම;
  - කාර්යාල නඩත්තු කටයුතු සහ කාර්යාලයේ පිරිසිදුකම පවත්වා ගැනීම සඳහා පරිපාලන අංශයට සහාය වීම.

**සුදුසුකම්**

- අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් සම්මාන 3 ක් සහිතව විෂයයන් 6 ක් සමත් වීම.

සහ

- වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් සහිත රියදුරෙකු ලෙස වසර පහක (05) පළපුරුද්ද,
- කොළඹ නාගරික බල ප්‍රදේශය තුළ පදිංචිව සිටීම අමතර සුදුසුකමක් වනු ඇත.

**පොදු නියමයන්**

- අයදුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 40 ට අඩු විය යුතු ය (රාජ්‍ය අංශයේ අයදුම්කරුවන්ට අදාළ නොවේ).
- සුදුසුකම් පැහැදිලිව පෙන්නුම් කරන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා සලකා බලනු ලැබේ.
- මේ සම්බන්ධව බාහිර බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සැළකේ.

**මෙම තනතුර සඳහා ආකර්ෂණීය වැටුපක් හිමිවේ.**

නියමිත අවශ්‍යතා ආවරණය වන පරිදි අදාළ සහතිකවල හා රියදුරු බලපත්‍රයේ පිටපත් සහ කරුණු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ සම්බන්ධතා තොරතුරු සමග **"රියැදුරු තනතුර"** ලෙස ඉහළ වම් කෙළවරේ සඳහන් කළ ලියුම් කවරයක බහාලූ අයදුම්පත්‍ර **2024 දෙසැම්බර් 01** වන දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයදුම්පත්‍ර ක්‍රියාවලිය සම්බන්ධව වැඩි දුර පැහැදිලි කරගැනීමට අවශ්‍ය නම් කරුණාකර 011 2396184/9 ඔස්සේ මූල්‍ය සහ පරිපාලන අංශය අමතන්න.


**අධ්‍යක්ෂ ජනරාල්,**

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව,**

**11 මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය,**

**කොළඹ 01.**

**වෙබ් අඩවිය : www.ircsl.gov.lk**


SEL ACINE